**ශීර්ෂය 210 - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 210- ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 08 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 234.90 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 193.47 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 41.43 ක් හෙවත් සියයට 17.64 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 216.36 | 179.64 | 36.72 | 16.97 |
| මූලධන | 18.54 | 13.83 | 4.71 | 25.40 |
| **එකතුව** | **234.90** | **193.47** | **41.43** | **17.64** |

**2.2 අත්තිකාරම් ගිණුම**

--------------------

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

----------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

----------------------------------------------

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 21001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 9.72 | 9.71 | 7.00 | 7.67 | 40.00 | 29.03 |

**2.3 අග්‍රිම ගිණුම**

------------

දෙපාර්තමේන්තුවේ 7002/0000/00/0246/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 9.96 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

----------------------

දෙපාර්තමේන්තුවේ අංක 6000/0000/00/0016/0075/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 8.9 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

----------------------

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

----------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 07 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුමකට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.18,353,966 ක් විය.

### 3.3 විසර්ජන ගිණුම

#### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 19 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හා විවිධ කළමනාකරණ දුර්වලතා හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එම වැය විෂයයන්ට අදාළව සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 ක සිට සියයට 92 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

### 3.4 අග්‍රිම ගිණුම්

මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 11 කට අවස්ථා 25 කදී එකතුව රු.710,700 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

### 3.5 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.7,348,912 ක්වූ තැන්පතු 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 21001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී, වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන මිය ගිය සහ වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.261,272 ක ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**3.7.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

----------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

**3.7.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුත්ත ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් කාලක්‍රමානුගතව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා පමණක් එම ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වුවද, එසේ සකස් කර නොතිබුණි.

**3.7.3 අභ්‍යන්තර විගණනය**

------------------------

දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර තිබුණි. එමගින් සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 11ක් නිකුත්කර තිබූ නමුත් අභ්‍යන්තර විගණන විමසුම් 04 ක් සඳහා දෙපාර්තමේන්තුවේ කළමනාකරණය විසින් පිළිතුරු ලබාදී නොතිබුණි.

**3.7.4 විගණන හා කළමනාකරණ කමිටුව**

-----------------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර පැවැත්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී එක් කමිටු රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

**3.8 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර සියයට 2.1 ක පොලී අනුපාතිකයක් මත 1999 දෙසැම්බර් 10 දින සැපයුම්කරු හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹි ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණ ණය ආධාර යටතේ ප්‍රංශ ප්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601) කට සමාන රු.මිලියන 102.2 කට 2003 වර්ෂයේදී මිලදී ගෙන තිබූ වර්ණ රසායනාගාරය සඳහා උපකරණ 2016 මැයි මාසය වන විටත් නිෂ්ක්‍රීයව හා නිසි නඩත්තු කිරීමකින් තොරව පැවතුණි. මේ සම්බන්ධයෙන් 2010 වර්ෂයේ ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබූ අතර, එහි නිර්දේශය වූයේ එම යන්ත්‍ර ප්‍රසිද්ධ ලංසු කැඳවීමක් මඟින් අලෙවි කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2016 මැයි 31 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2016 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

**ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් 13 ක් ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 4.6 ක් වූ රසායනාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම හා පර්යේෂණ අංශය අලුත්වැඩියා කිරීම.

(ආ) සංරක්ෂණාගාරය අලුත්වැඩියා කිරීම.

**3.10 අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ප්‍රකාශන කාර්යාංශයේ ඉහළ මාලය බෙදා වෙන්කිරීමේ කාර්යය සඳහා සවිස්තරාත්මක ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. සකස් කර තිබූ ඇස්තමේන්තුව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාගැනීමකින් ද තොරව අදාල කාර්යය එකතු කළ අගය මත බදු සහිතව රු.285,168 ක් ගෙවා තිබුණි. ඒ සඳහා වැඩ නිම කළ තාක්ෂණික නිලධාරියකුගේ සහතිකයක්ද ලබාගෙන නොතිබුණි.

(ආ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව වාහන හිමිකමක් නොමැති නිලධාරීන් දෙදෙනෙකුට වෙනත් විශේෂ අනුමැතියක්ද ලබාගැනීමෙන් තොරව මාස 02 ක කාලයක් සඳහා ඔවුන්ගේ පෞද්ගලික ගමන් බිමන් වෙනුවෙන් ඉන්ධන සඳහා රු.201,026 ක් වැය කර තිබුණි.

**3.11** පාඩු හා හානි

----------------

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නව මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම්වල සිදුවී තිබුණු අඩුපාඩු නිවැරදි කිරීමටත්, කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණු රු.6,623,624 ක් අයකර ගැනීමටත් කටයුතු කළයුතු බව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ දෙපාර්තමේන්තු නිලධාරීන් කළ සාකච්ඡාවේදී තීරණය කර තිබුණි. එම ගොඩනැගිල්ලේ අඩුපාඩු නිවැරදි කිරීම හා වැඩිපුර ගෙවීම් අයකර ගැනීම 2016 මැයි 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

**3.12** අනාර්ථික ගනුදෙනු

----------------------

දෙපාර්තමේන්තුවේ ශබ්ද අංශයේ 160 KVA ධාරිතාවයකින් යුත් බේකරයක් සවිකිරීම සඳහා 2015 ඔක්තෝබර් 12 දින රු.1,201,480 ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබුණි. එසේ මිලදී ගත් බේකරය 2016 අප්‍රේල් 30 දින වන විටත් සවිකර නොතිබුණි.

**3.13** විසඳා නොතිබුණි විගණන ඡේද

-----------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කිරීම් කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 4.2 | 2007 පෙබරවාරි 24 දිනැති අංක සීඑස්ජ්/සී1/40/2007 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයට පටහැනිව අධික මිල ගණන්වලට සුඛෝපභෝගී කාමර පහසුකම් ලබාගැනීම වෙනුවෙන් රු.611,788 ක් වැය කර තිබුණි. ඒ වෙනුවෙන් වූ ලිපිලේඛන කිසිවක් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශය සතුව නොමැති බව 2015 නොවැම්බර් 24 දින පිළිගෙන තිබුණ ද, රජයට වූ අලාභය අයකර ගැනීමට 2016 මැයි 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| 2014 | 4.13 | 2013 හා 2014 වර්ෂවල මාධ්‍ය සාකච්ඡා සඳහා ආහාර ලබා ගැනීමේදී රු.1,156,288 ක් වැඩිපුර ගෙවා තිබූ බව පිළිගෙන තිබුණ ද, වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2014 | 4.17 | පර්යේෂණ විෂය උපාධියේ විෂයයක් ලෙස හැදෑරූ නිලධාරීන් තිදෙනෙකු ඇතුළු නිලධාරීන් 07 දෙනෙකු සේවයේ නියුතු විශේෂ පර්යේෂණ ඒකකයක් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර තිබුණි. රටේ සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණයක් කිරීමට එම අංශයට පැවරීමකින් තොරව අවිධිමත් ලෙස ලංසු කැඳවා බාහිර ආයතනයකට රු.3,380,000 ක් ගෙවා තිබුණි. එම ආයතනය විසින් ලබාදුන් වාර්තාව කිසිදු කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. |

**3.14 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව යටතේ පවත්නා රජයේ ප්‍රකාශන කාර්යාංශයේ විකුණුම් ඉන්වොයිසි සැකසීම, පාරිභෝගිකයින්ට තොග හඳුනාගැනීමට පහසුකම් සැලැසීම, තොග ලේඛනගත කිරීම පිළිබඳ පරිගණක මෘදුකාංගයක් රු.600,000 ක ගෙවා 2008 වර්ෂයේදී ලබාගෙන තිබුණි. විකුණුම් ඉන්වොයිසි සැකසීම හැර අනෙකුත් කාර්යයන් සඳහා මෙම පරිගණක මෘදුකාංගය 2016 මැයි මාසය වන විටත් භාවිතා කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි හා ගෙවත්ත පිරිසිදු කරගෙනයාම වෙනුවෙන් 2015 මැයි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා පෞද්ගලික සමාගමක් වෙත රු. මිලියන 1.75 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් පරිදි අදාල සමාගම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(i) ගිවිසුම්ගත එකඟතාවයට අනුව පවිත්‍රතා කටයුතු සඳහා කම්කරුවන් විසිදෙනකු හා වැඩ පරීක්ෂකවරයකු සේවයේ යෙදවිය යුතු වුවද, නියමිත සේවක සංඛ්‍යාව යෙදවීමට එම ආයතනය අපොහොසත් වී තිබුණි. එම තත්ත්වය යටතේ බොහෝ දිනවල ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පවිත්‍රතා කටයුතුවලින් අනතුරුව එම සේවකයින්ම ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සේවයේ යොදවා ගෙවීම් කර තිබුණි.

(ii) සේවකයින්ගේ දෛනික පවිත්‍රතා කටයුතු හා පැමිණීම් වාර්තා වගකිව යුතු නිලධාරියකුගේ අධීක්ෂණයට ලක් නොවීම නිසා අදාල දිනය අවසානයේදී හෝ පසු දිනයේදී පැමිණීම හා පිටවීම අත්සන් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැළසී තිබුණි. ඒ අනුව ඉදිරිපත් කරනු ලැබූ පැමිණීම් පදනම් කරගෙන ගෙවීම් කර තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද නව මාධ්‍ය මධ්‍යස්ථානයේ සිවිවන මහලේ ඉදිකිරීම් කටයුතු water proofing නිසි පරිදි සිදු නොකිරීම නිසා ජල කාන්දුවීම්වලට ලක්වී එහි තීන්ත ආලේප හා බිත්තිවල සුමට ආලේප ගැලවී තිබුණි. එම අඩුපාඩු කොන්ත්‍රාත්කරු විසින් සිදුකර තිබුණත් එම තත්ත්වය දිගින් දිගටම වර්ධනය වී තිබුණි. ඉදිරිපස පිවිසුම් දොරටුව අසල වහලයට යොදා තිබූ විනිවිද පෙනෙන තහඩු ගොඩනැගිලි ඉදිකර වසර 4 ක් වැනි කෙටි කාලයකින් දිරාපත්වී තිබුණි. එම කොන්ත්‍රාත්කරුගේ අඩුපාඩු නිසා සිදුකර තිබුණු අළුත්වැඩියා වෙනුවෙන් රු.461,538 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

**3.15** **මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

-------------------------------------------

ශ්‍රී ලංකා මාධ්‍ය සමාජයේ මත්පැන් විකිණීමේ බලපත්‍රය 2008 වර්ෂයේ සිට විධිමත් ගිවිසුමකින් තොරව බාහිර පුද්ගලයෙකුට පවරා තිබුණි. ඒ සඳහා ඔහුගෙන් අයවිය යුතු රු.4,653,515 ක් 2016 මැයි මාසය වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද, මෙම බලපත්‍රය 2016 වර්ෂය සඳහා දීර්ඝ කිරීම අත්හිටවා ඇති බවට සාක්ෂිද ඉදිරිපත් කර නොතිබුණි.

**3.16** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 06 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 16 | 04 | 12 |
| (iii) | ද්විතියික මට්ටම | 227 | 180 | 47 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 45 | 07 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 20 | 09 | 11 |
| | **එකතුව** | **330** | **244** | **86** |